# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,863 - 2014 මැයි මස 16 වැනි සිකුරාදා - 2014.05.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ජේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 736 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 737 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 738 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 739 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 744 |


*සැ. යු.* - විසිදෙවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත 2014 අප්‍රේල් මස 25 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2014 ජුනි මස 06 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2014 මැයි මස 23 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2014 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


735- B 80838 - 2,875 (2014/05)
2B4 –

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**ශ්‍රී ලංකා දුම්රිය සේවයට ටින් කුට්ටි මෙට්‍රික් ටොන් 1ක් මිලදී ගැනීම**

ප්‍රසම්පාදන අංකය : SRS/F.7127

ශ්‍රී ලංකා දුම්රිය සේවයට ටින් කුට්ටි මෙට්‍රික් ටොන් එකක් (01) මිලදී ගැනීම සඳහා ශ්‍රී ලංකාව, කොළඹ, ඕල්කොට් මාවත, තැ. පෙ. 335, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් නිෂ්පාදකවරුන්/සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු කැඳවනු ලැබේ.

නිෂ්පාදකවරුන් තමන්ගේ ලංසු සෘජුව හෝ ඔවුන් විසින් ඇටෝර්නි බලයක් මගින් හෝ සෘජුවම බලය පවරන ලද බලයලත් නියෝජිතයින් මගින් යොමු කළ හැක.

02. 2014.05.28 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.

03. ආපසු ගෙවනු නොලබන රු. 2,500 ක ප්‍රසම්පාදන ගාස්තුවක් මුදලින්, පහසුවෙන් පරිවර්තන කළ මුදල් වර්ගයකින් ගෙවීමෙන් අනතුරුව 2014 මැයි මස 27 වැනි දින (ශ්‍රී ලංකා වේලාවෙන්) ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා දූත කාර්යාලවලින් ලබාගත හැකි ආකෘති පත්‍රවල පමණක් ලංසු ඉදිරිපත් කළ යුතුයි.

04. ලංසු භාරගැනීම අවසන් වූ වහාම ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට එම අවස්ථාවට පැමිණ සිටින මෙන් ඇරයුම් කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීමට හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10
ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩි විස්තර සඳහා පහත සඳහන් අය අමතන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත,
කොළඹ, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් :srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk
යොමු අංකය :SRS/F.7127

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

05-492

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිළ ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2014***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිළ ගණන් 2014 ජුනි මස 4 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලවල දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිළ ගණන් විවෘත කරනු ලැබේ. ඒ සඳහා වන විස්තර සහ ඉල්ලුම්පත්‍ර කාර්යාල වේලාවන් තුළ අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයෙන් සහ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයෙන් ආපසු නොගෙවන රු. 250.00 ක (රුපියල් දෙසිය පනහක) මුදලක් ගෙවා 2014 ජුනි මස 03 වැනි දින මධ්‍යාහ්න 12.00 තෙක් ලබාගත හැක.

*උපලේඛනය*

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *අයදුම්පත් හා අනෙකුත් විස්තර ලබාගත හැකි ස්ථාන* | *මිළ ගණන් භාරගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|---|
| බස්නාහිර පළාත | ගම්පහ | කටාන මීගමුව (බිම්සවිය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (බස්නාහිර පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, ගම්පහ | පළාත් සර්වේයර් ජනරාල් (බස්නාහිර පළාත) සර්වේයර් ජනරාල් කාර්යාලය, කිරුල පාර, කොළඹ 5 | කටාන හෝ අවට | 2014 ජුනි 15 |
| වයඹ පළාත | කුරුණෑගල | මල්ලවපිටිය (බිම්සවිය) | පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය (වයඹ පළාත)/ දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය, (කුරුණෑගල) | පළාත් සර්වේයර් ජනරාල් (වයඹ පළාත) පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, කුරුණෑගල | මල්ලවපිටිය හෝ අවට | 2014 ජුනි 15 |

කවරයේ ඉහල වම් කෙළවරෙහි "ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම" (ස්ථාන නාමය) යනුවෙන් සඳහන් කරන ලද මිළ ගණන් සපුරාලිය යුතු අවශ්‍යතා විස්තරය ද සහිතව 2014 ජුනි මස 04 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2014 අප්‍රේල් මස 30 වැනි දින.
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

05-434

# බඩු බාහිරාදිය විකිණීම්

*මගේ අංකය : ඇ. ම. උ. වෙන්දේසි 2014*

**මහෙස්ත්‍රාත් අධිකරණය - ඇඹිලිපිටිය**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2014 ජුනි මස 21 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලිඛිතව අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය 1/2 කට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය මගින් කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

06. වෙන්දේසියෙන් භාණ්ඩ මිල දී ගන්නා ගැනුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

කේ. කේ. දිනේෂ් ලක්මල් පෙරේරා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
ඇඹිලිපිටිය.

2014 අප්‍රේල් මස 24 වැනි දින,
ඇඹිලිපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසි 09**

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 80692/12 | අත්ට්‍රැක්ටර් එන්ජින් | 01 |
| 02. | 93883 | අත්ට්‍රැක්ටර් | 01 |
| 03. | 55111/11 | අත්ට්‍රැක්ටර් | 01 |
| 04. | 84024 | අත්ට්‍රැක්ටර් | 01 |
| 05. | අංක රහිත | අත්ට්‍රැක්ටර් | 01 |
| 06. | අංක රහිත | අත්ට්‍රැක්ටර් | 01 |
| 07. | අංක රහිත | අත්ට්‍රැක්ටර් | 01 |
| 08. | අංක රහිත | අත්ට්‍රැක්ටර් | 01 |
| 09. | අංක රහිත | ADOZE 1011024 යතුරු පැදිය | 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 10. | අංක රහිත | එන්ජින් අංක CF 50 E 2782601 චැසි අංක CF 2782602 දරන යතුරු පැදිය | 01 |
| 11. | අංක රහිත | චැසි අංක MD 90 – 2008762 එන්ජින් අංක MD 90 E 2008813 දරන යතුරු පැදිය | 01 |
| 12. | අංක රහිත | චැසි අංක AD 02 -1031122 දරන යතුරුපැදිය | 01 |
| 13. | AR 680/11 | 156-6207 දරන යතුරු පැදිය | 01 |
| 14. | අංක රහිත | 106-1201 දරන යතුරුපැදිය | 01 |
| 15. | අංක රහිත | 5 ශ්‍රී 7067 යතුරු පැදිය | 01 |
| 16. | අංක රහිත | 89-8275 දරන යතුරු පැදිය | 01 |
| 17. | අංක රහිත | 89-9636 දරන යතුරු පැදිය | 01 |
| 18. | අංක රහිත | 120-6884 යතුරු පැදි | 01 |
| 19. | අංක රහිත | 113-7266 දරන යතුරුපැදිය | 01 |
| 20. | අංක රහිත | EN-50E -2536900 යතුරු පැදිය | 01 |
| 21. | අංක රහිත | 108-3917 යතුරු පැදිය | 01 |
| 22. | අංක රහිත | 158-4696 යතුරු පැදිය | 01 |
| 23. | අංක රහිත | 131-7475 යතුරු පැදිය | 01 |
| 24. | අංක රහිත | 152-7551 යතුරුපැදිය | 01 |
| 25. | අංක රහිත | TA - 4223 යතුරු පැදිය | 01 |
| 26. | 853/12 | 140-5481 යතුරුපැදිය | 01 |
| 27. | 1320/12 | ZKZO - 50903402 දරන වතුර මෝටර් | 01 |
| 28. | 97613 | කෙමැක්ස් වර්ගයේ ජංගම දුරකතන | 01 |
| 29. | AR 316/12 | සැම්සන් වර්ගයේ ජංගම දුරකතන | 01 |
| 30. | AR 1482/10 | නොකියා වර්ගයේ ජංගම දුරකතන | 01 |
| 31. | අංක රහිත | වාහන වලට සවිකරන ලද ටයර් කිහිපයක් | |
| 32. | අංක රහිත | යකඩ බැරල් තොගයක් | |
| 33. | අංක රහිත | ගැරුම් වට්ටි කිහිපයක් | |
| 34. | අංක රහිත | වීදුරු බෝතල් තොගයක් | |
| 35. | | විනිසුරුතුමාගේ නිල රථයෙන් ඉවත් කරන ලද ටයර් | 04 |
| 36. | අංක රහිත | දිරාගිය ඇලුමිනියම් වලං කිහිපයක් | |
| 37. | අංක රහිත | දිරාගිය යකඩ බාල්දි කිහිපයක් | |
| 38. | අංක රහිත | සවල් කිහිපයක් | |
| 39. | අංක රහිත | කුඩා උදලු කිහිපයක් | |
| 40. | අංක රහිත | ප්ලාස්ටික් බුලි කිහිපයක් | |
| 41. | අංක රහිත | පැදුරු කිහිපයක් | |
| 42. | | භාණ්ඩ සමීක්ෂණයෙන් වෙන්දේසිය සඳහා අනුමත කරන ලද කටු ඇමුණුම් යන්ත්‍ර | 06 |
| | | යතුරු ලියන යන්ත්‍ර | 01 |
| 43. | අංක රහිත | දිරාගිය විවිධ ප්‍රමාණයේ ප්ලාස්ටික් වතුර බට තොගයක් | |
| 44. | 98478 | නිල්පාට පොලියෙස්ටර් වර්ගයේ මීටර් 25 අඩි 02 දිග රෙදි කැබලි | 01 |
| 45. | අංක රහිත | දිරාගිය වානේ කම්බි කිහිපයක් | |

05-457

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

2014/2015 වර්ෂය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම

2014 ජූලි මස 01 වැනි දින සිට 2015 ජුනි මස 30 වැනි දින දක්වා කාලය තුළ රා සිල්ලරට විකිණීම සඳහා පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රා තැබෑරුම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම ඕනෑම ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර, පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ටෙන්ඩර් මුදල් තැන්පත් කළ බවට ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ටෙන්ඩරයේ සඳහන් මුදලෙන් යටත් පිරිසෙයින් (15%) වටිනාකමට ලබාගත් වත්කම් සහතිකයක් ද ඊට ඇමිණිය යුතු ය.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද සෑම ටෙන්ඩරයක්ම මුද්‍රා තබන ලද කවරයක බහා එහි මුදුනෙහි වම් කෙළවරෙහි "අංක................. දරන.......................... රා තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් පහත සඳහන් උපලේඛනයේ සඳහන් පරිදි තැබෑරුමේ නම සහ අංකය සඳහන් කර 2014.05.20 වැනි දින පෙ.ව. 10.30 ට පෙර හලාවත ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් එම වේලාවට පෙර හලාවත ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ ටෙන්ඩර් පෙට්ටියට බහාලිය යුතු ය.

04. ටෙන්ඩර් ඉදිරිපත් කිරීම 1982.08.20 වැනි දින පළවී ඇති අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* දැක්වෙන රා රේන්ද කොන්දේසිවලට අනුකූල විය යුතු ය.

05. 2014.05.20 වැනි දින පෙ.ව. 10.30ට ටෙන්ඩර් පත්‍ර බාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. එම අවස්ථාවේ ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට හලාවත ප්‍රාදේශීය මහලේකම් කාර්යාලයේ පෙනී සිටිය හැකිය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වන රා තැබෑරුම් නැවත විකිණීම 2014.06.04 වැනි දින පෙ.ව 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. මේ සම්බන්ධයෙන් වැඩි විස්තර හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය. (දුරකථන අංකය : 032-2223205).

යූ. එස්. එන්. ප්‍රනාන්දු,
ප්‍රාදේශීය ලේකම්,
හලාවත.

2014 අප්‍රේල් මස 24 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
හලාවත.

**උපලේඛනය**

| *අනු. අංකය* | *කොට්ඨාසය* | *ග්‍රාමය* | *ටෙන්ඩර් භාරගන්නා දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* |
|---|---|---|---|---|
| 01 | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 02 දරන කොට්ඨාසය | ඉච්චම්පිටිය | 2014.05.20 පෙ.ව. 10.30 | 2,000 0 |
| 02 | හලාවත පළාත් ආණ්ඩු සභාවට අයත් අංක 03 දරන කොට්ඨාසය | කොට්ඨාසය තුළ වෙනත් සුදුසු ස්ථානයක් සොයා ගත යුතු ය | එම | 1,000 0 |
| 03 | උතුරු පිටිගල් කෝරළේ | ඔලිදළුව | එම | 250 0 |

05-391

# රජයේ නොවන දැන්වීම්

## දැනුම් දීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ වගන්ති 9 (1) අනුව 2014 අප්‍රේල් මස 04 වැනි දින පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබූ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : අයිකොනික් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 98008
ලියාපදිංචි ලිපිනය : අංක 89/4, ඉල්ලවතුර, ගම්පොල

අධ්‍යක්ෂක.

05-344

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : මිල්ටන් කේන්ස් එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී බී 3866
ලියාපදිංචි කළ දිනය : 2010.0903
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 6 වැනි මහල, නැගෙනහිර කුළුන, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී. ටී. එල්. මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

05-347

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සිලෝන් වයිල්ඩ්ලයිෆ් ඒජන්සි (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : ජී එල් 2258
ලියාපදිංචි කළ දිනය : 2013.07.24
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 63/2, යහම්පත් මාවත, පිළියන්දල පාර, මහරගම.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී. ටී. එල්. මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

05-348

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : විලියම්ස් ඇසෝසියේට් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 75889
ලියාපදිංචි කළ දිනය : 2010.12.07
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 01, නව රෙනිල් වතුයාය, හිඳගොල්ල, කුරුණෑගල.

අධ්‍යක්ෂක අණ පරිදි,

වී. ටී. එල්. මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

05-349

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : සී පී එන් කන්ස්ට්‍රක්ෂන්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 84664
ලියාපදිංචි කළ දිනය : 2012.03.02
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : 8 සී වී හේන, පළුවෙල්ගල පාර, කොස්වත්ත

අධ්‍යක්ෂක අණ පරිදි,

වී. ටී. එල්. මැනේජ්මන්ට් සර්විසස් (පී වී ටී) එල් ටී ඩී,
සමාගම් ලේකම්වරු.

05-350

---

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාගත කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්ති ප්‍රකාරව කරනු ලබන දැන්වීම

සමාගමේ නම : ලංකා ගොවි සහන සංවර්ධන පදනම
ලියාපදිංචි අංකය : ජී. ඒ. 2748
ලියාපදිංචි කළ දිනය : 2012.11.20
සමාගමේ ලිපිනය : අංක 13, ගොවි මාවත, හිඟුරක්ගොඩ.

05-351

---

## නිවේදනයයි

සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්

2014 අප්‍රේල් මස 22 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සෙලින්කෝ ජෙනරල් ඉන්ෂුවරන්ස් ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 5184
ලියාපදිංචි කාර්යාලය : "සෙලින්කෝ හවුස්", 3 වැනි මහල, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.

05-393

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ස්ටැපල් හෝල්ඩිංස් (පුද්.) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 96103
ලියාපදිංචි කාර්යාලය : අංක 35, අරණායක පාර, මාවනැල්ල
සංස්ථාපිත කළ දිනය : 2013 දෙසැම්බර් මස 13 වැනි දින.

අධ්‍යක්ෂක මණ්ඩලයේ අණ පරිදි,

05-398

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන දැනුම් දීමයි.

සමාගමේ නාමය : හර්ෂන ඉංජිනියරින් කන්ස්ට්‍රක්ෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 98216
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 1/18 ඒ, දික්කන්ද පාර, වැලිගම්මුල්ල
සංස්ථාගත කළ දිනය : 2014 අප්‍රේල් මස 22 වැනි දින.

සමාගම් අධ්‍යක්ෂ.

05-400

---

## සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන පරිදි පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : කසුන් එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 72910
ලියාපදිංචි දිනය : 2010.06.29
ලියාපදිංචි කළ ලිපිනය : අංක 1/4, හැඩිගම, අළුත් පාර, කොලමුන්න, පිළියන්දල.

වී. පී. තිලකරත්න,
සමාගම් ලේකම්.

05-425/1

---

## සමාගමක් සංස්ථාගත කිරීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියෙහි විධිවිධාන පරිදි පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත පෞද්ගලික සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : බෙන්ස් ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 84621
ලියාපදිංචි දිනය : 2012.03.01
ලියාපදිංචි කළ ලිපිනය : අංක 11/1, පළමු මහල, 33 වැනි පටුමග, වැල්ලවත්ත.

ඇක්සස් කම්පැනි ප්‍රයිවට් ලිමිටඩ්,
සමාගම් ලේකම්.

05-425/2

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ජීවන් ගේස්ට් හවුස් ඇන්ඩ් රිසෙප්ෂන්ස් හෝල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 මාර්තු මස 13 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ජීවන් ගේස්ට් හවුස් ඇන්ඩ් රිසෙප්ෂන්ස් හෝල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී. වී. 97569
ලියාපදිංචි ලිපිනය : අංක 52, මහියංගනය පාර, විලමුන, තෙල්දෙනිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

විලමුන වලව්වේ සේනාරත්න විලමුන,
ලේකම්.
දුරකථන අංක : 071 8244 495/077 8197041.

05-427

---

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඒ. ඩී. ඒ. ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 මාර්තු මස 21 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඒ. ඩී. ඒ. ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 97733
ලියාපදිංචි ලිපිනය : අනුරුද්ධ ගෘහ භාණ්ඩ, මහගම ජනපදය, සෙවනගල, ශ්‍රී ලංකාව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ප්‍රවර්ධකයෝ
දුරකථන අංක : 071 8244 495/077 8197041.

05-428

---

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ගෝලෝබල් ලැබෝරට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 අප්‍රේල් මස 03 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ගෝලෝබල් ලැබෝරට් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 97969
ලියාපදිංචි ලිපිනය : දොන් විමලකීර්ති මාවත, රජවැල්ල, දිගන, මහනුවර, ශ්‍රී ලංකාව.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්.
දුරකථන අංක : 071 8244 495/077 8197041.

05-432

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව ඩිබ් හෝල්ඩින් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 අප්‍රේල් මස 11 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ඩිබ් හෝල්ඩින් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 98 147
ලියාපදිංචි ලිපිනය : අංක 22/10, විද්‍යාකර මාවත, මහරගම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.
දුරකථන අංක : 071 8244 495/077 8197041.

05-433

---

### මහජන දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව එල් ටී පෙරේරා හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජූලි මස 08 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : එල් ටී පෙරේරා හෝල්ඩින් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 93441
ලියාපදිංචි ලිපිනය : අංක 380, තෙලවල පාර, ගල්කිස්ස.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ලේකමගේ තුසිත ප්‍රසන්න පෙරේරා,
අධ්‍යක්ෂ.
දුරකථන අංක : 071 8244 495/077 8197041.

05-435

---

### හොටෙල් නල්ලූර් ලිමිටඩ්

(ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම)
සමාගමේ ලියාපදිංචි අංකය : PB 3815

**2007 අංක 07 දරන සමාගම් පනතේ 346 (1) වගන්තිය යටතේ ඒකාබද්ධ ඈවරකරුවන් පත්කිරීමේ දැන්වීම**

2014 අප්‍රේල් මස 25 වැනි දින කොළඹ 03, ශාන්ත මයිකල් පාර, අංක 28, බෑන්ක් ඔෆ් සිලෝන් මර්චන්ට් ටවර්, දරන ස්ථානයේ පිහිටි හොටෙල් නල්ලූර් ලිමිටඩ් සමාගමේ පැවති ණය හිමියන්ගේ රැස්වීමේ දී, කොළඹ 04, කාසල් පටුමගේ අංක 02, හතරවන මහල එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් හි හවුල්කරුවන් සහ වරලත් ගණකාධිකාරින් වන පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ් ඒකාබද්ධ ඈවරකරුවන් වශයෙන් පත්කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
ඒකාබද්ධ ඈවරකරුවන්,
හොටෙල් නල්ලූර් ලිමිටඩ්.

2014 අප්‍රේල් මස 29 වැනි දින,
එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් බාරේ,
ප්‍රතිව්‍යුහගත කිරීම හා ආයතනික අයකර ගැනීම්,
4 වන මහල, අංක 02, කාසල් පටුමග,
කොළඹ 04.

05-424/1

## හොටෙල් නල්ලූර් ලිමිටඩ්

සමාගමේ ලියාපදිංචි අංකය PB 3815

**2007 අංක 07 දරන සමාගම් පනතේ 320 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

2014 අප්‍රේල් මස 25 වැනි දින සම්මත වූ ණය හිමියන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීම සඳහා වූ විශේෂ යෝජනාව

සමාගම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 333 වැනි වගන්තිය යටතේ පැවැති ණයහිමියන්ගේ රැස්වීමේ දී ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට සම්මත කරන ලදී.

අධ්‍යක්ෂක මණ්ඩලය,

හොටෙල් නල්ලූර් ලිමිටඩ්.

05-424/2

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : නුවරඑළිය එනර්ජි ඩිවලොපර්ස් (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : PV 98222
ලියාපදිංචි ලිපිනය : කරගස්තැන්න, නාරන්පනාව.

අනුමැතිය සමාගම් අධ්‍යක්ෂකවරු.

05-438

---

## පොදු නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 11 (5) වගන්තිය අනුව සමාගමේ තත්ත්වය වෙනස් කිරීම හේතුවෙන් නම වෙනස් කිරීම පිළිබඳ මහජන දැනුම්දීමයි.

කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ නිල ලැයිස්තුගත කිරීම ලිඛිතව හිමිවීම සහ සමාගමේ තත්ත්වය සීමිත සමාගමක සිට පොදු සීමිත සමාගමක් බවට පත් කිරීම සඳහා කොටස් හිමියන්ගේ අනුමැතිය විශේෂ යෝජනාවක් මගින් 2014 අප්‍රේල් මස 29 වැනිදා සම්මත වීම සමග 2007 අංක 07 දරන සමාගම් පනතේ (පනත) 11 (3) වගන්තිය අනුව සමාගමේ අගට ඇති "ලිමිටඩ්" (Limited) වචනය වෙනුවට "පීඑල්සී" (PLC) යන වචනය යෙදීම මගින් සමාගම් පනතේ (පනත) 8 (1) වගන්තියේ විධිවිධාන වලට අනුකූලව සමාගමේ නම වෙනස් කිරීම පිණිස යෝජනා සම්මත කරගනු ලැබූ ලෙස සලකන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ තොරතුරු පහත දැක්වෙන පරිදි වේ :-

සමාගමේ නම : ඇලුමෙක්ස් ලිමිටඩ් (තත්ත්වය වෙනස් කිරීමට පෙර)
සමාගමේ නම : ඇලුමෙක්ස් පීඑල්සී (තත්ත්වය වෙනස් කිරීමෙන් පසු)
සමාගමේ ලියාපදිංචි අංකය : PV 539 PB
ලියාපදිංචි ලිපිනය : සපුගස්කන්ද, මාකොළ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

හේලීස් ගෲප් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2014 අප්‍රේල් මස 30 වැනි දින,
අංක 400, ඩීන්ස් පාර,
කොළඹ 10.
05-491

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : බියෝන්ඩ් ජස්ට්වර්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 97480
ලියාපදිංචි කාර්යාල ලිපිනය : 42 - 2/2, රුඩ්රා මාවත, කොළඹ 06
සංස්ථාගත කළ දිනය : 2014.03.26.

ලේකම්.

05-416

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව සංස්ථාගත කිරීමයි

සමාගමේ නම : අගාවුඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි කාර්යාලය : අංක 841/3, සියඹලාපේ වත්ත, දෙල්ගොඩ
ලියාපදිංචි අංකය : පී. වී. 97346
ලියාපදිංචි දිනය : 2014.03.03.

අධ්‍යක්ෂ.

05-417

---

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව මෝගන් - ඩේවිස් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන නාමය මෝගන්-ඩේවිස් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ් ලෙස 2014 මාර්තු මස 26 වැනි දින සිට වෙනස් කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පැවැති නාමය : මෝගන් - ඩේවිස් ප්‍රොපර්ටීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : මෝගන් - ඩේවිස් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 78618
සමාගමේ ලිපිනය : සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්, සමාගම් ලේකම්වරු, අංක 10, හැව්ලොක් පෙදෙස, කොළඹ 05.

සෙක්‍රටේරියල් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 10, හැව්ලොක් පෙදෙස,
කොළඹ 05.

05-420

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම 2007 ඔක්තෝබර් මස 11 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : කින්ඩම් බිස්නස් සොලුෂන්ස් පුද්ගලික සමාගම
සමාගමේ අංකය : පී. වී. 98122
ලියාපදිංචි කළ දිනය : 2014.04.10
ලියාපදිංචි ලිපිනය : අංක 17, මන්රෙසා පාර, මඩකලපුව.

ජෝසප් සෙක්‍රටේරියල් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

2014 අප්‍රේල් මස 22 වැනි දින.

05-525/1

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම 2013 සැප්තැම්බර් මස 13 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : ෆියොරෙන්ට් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පී. වී. 97220
ලියාපදිංචි කළ දිනය : 2014.02.24
ලියාපදිංචි ලිපිනය : අංක 108, විවේකානන්ද හිල්, කොළඹ 13.

ජෝසප් සෙක්‍රටේරියල් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

2014 අප්‍රේල් මස 30 වැනි දින.

05-525/2

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සීමිත වගකීම් සහිත සමාගම 2013 සැප්තැම්බර් මස 13 වැනි දින සංස්ථාගත කරන ලද බැව් මෙයින් දන්වා සිටිමු.

සමාගමේ නම : කයිරෝස් (පුද්ගලික) සමාගම
සමාගම් අංකය : පී. වී. 97215
ලියාපදිංචි කළ දිනය : 2014.02.24
ලියාපදිංචි ලිපිනය : අංක 108, විවේකානන්ද හිල්, කොළඹ 13.

ජෝසප් සෙක්‍රටේරියල් සර්විසස් (පුද්ගලික) සමාගම,
සමාගමේ ලේකම්වරු.

2014 අප්‍රේල් මස 30 වැනි දින.

05-525/3

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව අප විසින් මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ කලින් නම : ඩේටාටෙක් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 6358
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 85, බ්‍රේබෲක් පෙදෙස, කොළඹ 02
සමාගමේ අලුත් නම : මෙට්‍රොපොලිටන් ෆොටෝහබ් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සමාගම සඳහා සහ වෙනුවෙන්,

පී ඩබ්ලිව් කෝපරේට් සෙක්‍රටේරියල් (පී වී ටී) එල්ටීඩී,
සමාගම් ලේකම්වරු.

05-524

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආයතනය සීමිත වගකීම් සහිත සමාගමක් ලෙස සංස්ථාගත කරන්නට යෙදුන බැව් මෙයින් දන්වා සිටිමි.

සමාගමේ නම : ෆයින් ලයින් අයි ඇන්ඩ් ඊ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : PV 97912
සංස්ථාගත කළ දිනය : 2014.03.31
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : UG 117-121, පීපල්ස් පාර්ක් සංකීර්ණය, පිටකොටුව.

සමාගම් අධ්‍යක්ෂක.

05-523

---

### 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

සමාගමේ නම : කයුමු ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 98179
දිනය : 2014.04.22
ලියාපදිංචි ලිපිනය : මැක්ලරන්ස් ගොඩනැගිල්ල, 02 වැනි මහල, අංක 123, බෞද්ධාලෝක මාවත, කොළඹ 04
සමාගමේ ලේකම් : සී මැතිව් සහ කො. (පුද්ගලික) සමාගම. එස්. ඊ. සී. /(2) 2013/311.

05-509

### දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : ජී. ඒ. පී. ටුවර්ස් ඇන්ඩ් ඒජන්සීස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : වටද්දර, වේයන්ගොඩ
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 95953
සංස්ථාගත කළ දිනය : 2013.12.12.

ලේකම්.

05-504

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

170/6 ගංගානි උයන, මාදොල. අවිස්සාවේල්ල පදිංචි ශාන්ත ප්‍රදීප් කුලරත්න වන මම ශ්‍රී ලංකා රජයටත් සාමාන්‍ය ජනතාවටත් කරන ලද දැනුම් දීම නම් නීතිඥ ජී. රදම්පොල ගමගේ මහතා විසින් සහතික කරන ලද අංක 791 ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකාර වන ඉහත ලිපිනය පදිංචි උඳුගොඩගේ තුෂාරි සංජීවනී පෙරේරා පත් කරනු ලැබූ අතර මෙතැන් සිට එම පත්කිරීම අවලංගු කරන බව දැනුම් දෙමි.

05-552

### සිලෝන් ටී ගාඩ්න්ස් ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 324 : (3) සහ 334 :(2) වගන්තිය යටතේ ණයහිමියන්ගේ රැස්වීම පිළිබඳ කරනු ලබන නිවේදනයයි.

2007 අංක 07 දරන සමාගම් පනතේ 324 (3) සහ 334 (2) යන වගන්ති වලට අනුකූලව වර්ෂ 2014 ක් වූ ජූනි මස 13 වැනි දින පෙරවරු 10.00 ට කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 153 දරන ස්ථානයේ දී ඉහත සමාගමෙහි ණයහිමියන්ගේ රැස්වීමක් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. (තවද, එදින රැස්වීමට සහභාගි නොවන ණයහිමියන් වෙතොත් වර්ෂ 2014 ක් වූ ජූනි මස 11 වැනි දින හෝ ඊට පෙර පස්වරු 3.00 ට කොළඹ 05, නාරාහේන්පිට, නාවල පාර, අංක 153 දරන ස්ථානයේ සමාගම් කාර්යාලයෙහි අදාල පෙරකලාසි ගොනු කරන ලෙස ද දැනුම් දෙනු ලැබේ.)

තවද, ණයහිමියන්ගේ රැස්වීමට පෙර සියලු ණයහිමියන්ගේ හිමිකම්, සුරක්ෂිත ණය හිමියන්ගේ සුරක්ෂණ ප්‍රකාශ, ඒවා ලබාදුන් දිනයන්, සහ තක්සේරු කරනු ලැබූ වටිනාකම් සහිත ඡන්දය ප්‍රකාශ කිරීමේ අරමුණු ඉහත සඳහන් ලිපිනය දරන සමාගම් කාර්යාලය වෙත භාර දෙන ලෙස නිවේදනය කරනු ලැබේ.

වර්ෂ 2014 ක් වූ මැයි මස 02 වැනි දින දී ය.

සිලෝන් ටී ගාඩ්න්ස් ලිමිටඩ්,
අධ්‍යක්ෂ මණ්ඩලය.

සටහන : සමාගමේ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සම්බන්ධයෙන් ඈවරකරුවකු නම් කිරීම සහ ගණන් බේරා වසා දැමීමේ කටයුතු සඳහා පරීක්ෂණ කමිටුවක්, අවශ්‍යතාවය මත මෙම රැස්වීමේ දී නම් කළ හැක.

05-526

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගම්පහ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පදිංචියට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පහ මහ නගර සභා යක්කල උප කාර්යාල සීමාවන් තුළ ගම්පහ ඉදිගොල්ල පාරේ පිහිටි ඉදිගොල්ල එස්ටේට් ඉඩමෙන් බලයලත් මානක ඩබ්. ඒ. නිහාල් විසින් 2006.12.12 වැනි දින සාදන ලද අංක 1807 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කළ ලොට් 1 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු අනෙකුත් සියළු දේ.

ඉඩමේ ප්‍රමාණය : පර්චස් 48.

මෙම දේපළ සීමාසහිත ඇට්ටොටෙක් සිස්ටම්ස් ඉන්ජිනියරින් (පුද්.) සමාගම බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම.* - ගම්පහ නගර මධ්‍යයේ සිට යක්කල මාර්ගයේ කි. මී. 02ක් පමණ ඉදිගොල්ල හන්දිය දක්වා පැමිණ වම් දෙසට හැරී පල්ලිය පාරේ මීටර් 700ක් පමණ පල්ලිය දක්වා ගමන් ගෙන නැවත වමට හැරී හමුවන බොරළු පාරේ අවසානය දක්වා ගියවිට අදාළ දේපළ පිහිටා තිබේ.

2014 ක් වූ ජූනි මස 23 වැනි දින ප. ව. 2.00 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2013.02.22 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2013.02.27 වැනි දින ලක්බිම, තිනකරන් හා 2013.02.28 වැනි දින ඩේලිමිරර් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය.-* මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකාර (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 011-2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081- 2210595/071-4755974/071- 8446374/077-7761706.

05-507

---

**හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ගම්පහ ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**ඉතා වටිනා පදිංචියට සුදුසු දේපළක්**

*1 වන විකිණීම* .- 2014 ජුනි මස 23 වැනි දින පෙ. ව. 10.00 ට ගම්පහ මහ නගර සභා සීමාවන් තුළ අලුත්ගම ගමේ පිහිටි බණ්ඩාරවත්ත වතුයාය නැමැති ඉඩමෙන් බලයලත් මානක සිරි ඩී. ලියනසූරිය විසින් 1983.04.21 වැනි දින සාදන ලද අංක 2763 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කරන ලොට් 43 දරන ඉඩම් කැබැල්ල හා එහි තුළ පිහිටි ඉසුරු මාවත වරිපනම් අංක 60/8 දරන දේපළ ඇතුළු සියලු දේ. ප්‍රමාණය පර්චස් 18.

*2 වන විකිණීම*.- 2014 ක් වූ ජුනි මස 23 වැනි දින පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගම්පහ මහ නගර සභා සීමාවන් තුළ මැදගම ගමේ පිහිටි බණ්ඩාරවත්ත නමැති ඉඩමෙන් බලයලත් මානක ඩබ්. ඒ. යූ. සෙනරත් විසින් 2005.04.11 වැනි දින සාදන ලද අංක 2890 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලොට් 01 දරන ඉඩම් කොටස හා එහි තුළ පිහිටි පැරකුම් මාවත, වරිපනම් අංක 180 දරන දේපළ ඇතුලු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය : පර්චස් 45.4.

මෙම දේපළ සීමාසහිත ඇට්ටොටෙක් සිස්ටම්ස් ඉන්ජිනියරින් (පුද්ගලික) සමාගම බන්ධනදායි වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

යෝජනා සම්මුතිය සඳහා 2013.02.22 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2013.02.27 වැනි දින ලක්බිම, තිනකරන් හා 2013.03.17 වැනි දින ඩේලිමිරර් පුවත්පත් බලන්න.

*ගෙවීමේ ක්‍රමය*.- මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතුය :-

1. ගැනුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2000.

ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න : ජ්‍යෙෂ්ඨ කළමනාකාර (අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 011-2661835, 011-2661836, 011-2661826.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු
පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර, මාවිල්මඩ මහනුවර,
දුරකථන අංක : 081- 2210595/071-4755974/071- 8446374/077-7761706.

05-508

---

**මහජන බැංකුව - විශේෂ වත්කම් ඒකකය**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 වසරේ අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ඩී වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ කෝට්ටේ, නගර සභා සීමාවට අයත්, පාගොඩ නාගවිහාර පාරේ පිහිටි, දෙල්ගහකුරුදුවත්ත ලෙස හැඳින්වෙන බලයලත් මිනින්දෝරු අයි. ඩබ්. ඩබ්. ඉන්දතිස්ස විසින් සාදන ලද 1967 දෙසැම්බර් මස 08 වැනි දිනැති අංක 2665 දරන පිඹුරේ ලොට් අංක එෆ් 3 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදා වෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 20
එහි පිහිටි අංක 5/29 දරන නිවස පස, ගස්වැල්, වගාවන් සහ සියල්ල ද එයට අඩංගු වන සියල්ල ද සහිතව සහ ඉහත කී අංක 665 දරන පිඹුරට අනුව කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ අංක එම් 878/300 බී යටතේ ලියාපදිංචි කර ඇත.

මෙම දේපළ අංක UG 125 පීපල්ස් පාර්ක් ගොඩනැගිල්ල ගැස්පහ විදිය, කොළඹ 11 යන ස්ථානයේ එඩ්වින් බුක් ඉන්ඩස්ට්‍රීස් සහ එඩ්වින්

ඉම්පෝර්ට්ස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනය නම් තනි පුද්ගල ව්‍යාපාරය පවත්වාගෙන යන මුකදම් වසම් එඩ්වින් සෙනෙවිරත්න විසින් මහජන බැංකුවට උකස් කරන ලද්දකි.

මහජන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ 2014 ජුනි 05 වැනි දින (බ්‍රහස්පතින්දා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*තීරණය පිළිබඳ දැන්වීම.* - කරුණාකර 2002 නොවැම්බර් මස 01 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2002 ඔක්තෝබර් මස 19 වැනි දින දිනමිණ පුවත්පත් ද, 2002 ඔක්තෝබර් මස 11 සහ 16 වැනි දිනවල සිලෝන් ඩේලි නිව්ස් පුවත්පත් ද 2002 ඔක්තෝබර් මස 16 වැනි දින තිනකරන් පුවත්පත් ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසානයේ පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
5. අලෙවිය සඳහා වූ පිරිවැය සහ අනෙකුත් ගෙවීම් පවතී නම් එම ගෙවීම්,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර බදු.

ගැණුම් මිලෙන් 90% (සියයට අනූව) ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රධාන කළමණාකරු ණය අයකර ගැනීම්, විශේෂ වත්කම් ඒකකය, මහජන බැංකුව, ප්‍රධාන කාර්යාලය, (පළමු මහල), අංක 75, සර් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් කළ පරිදි දින 30ක් ඇතුළත ඉහත සඳහන් කරන ලද මුලු මුදල් ගෙවනු නොලැබුවහොත් දැනටමත් ගෙවනු ලැබ ඇති විකුණුම් මිලෙන් 10% ක මුදලක් බැංකුව සන්තක කිරීමේ සහ දේපළ නැවත වෙන්දේසි කිරීමේ බලය බැංකුව සතුවේ.

දුරකථන අංක : 011-2431033, 011-2481569 ෆැක්ස් අංකය : 011- 2431033.

ඔප්පු සහ අනෙකුත් ලියකියවිලි වල පිටපත් ඉහත කී ලිපිනයෙන් ලබාගත හැක.

"ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/ අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි"

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්.
වසර 122 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05,
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

05-517

---

හැටන් නැෂනල් බැංකුව පීඑල්සී - මාතලේ ශාඛාව
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව)

1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු මාතලේ දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පල්ලෙසිය පත්තුවේ වගාපනහ දඹුලුඹය ග්‍රාමයේ *නොහොත්* තිත්තවැල්ගොල්ලේ හි පිහිටි වම්බටුයාය පලුගහයාය පලුකන්දයාය ගලේයාය සහ කොස්වත්තමුල්ලේකුඹුර දැන් විජේසිරිවත්ත ලෙස හැඳින්වෙන ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එම්. අනුරරත්න විසින් මැන සාදන ලද 2000.01.31 දාතම හා අංක 670 දරන පිඹුරෙන් නිරූපිත ලොට් 1 වශයෙන් දක්වා ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කළ බිම් කොටස ප්‍රමාණයෙන් අක්. 0, රූඩ් 2, පර්. 25.

*ඉඩමට ප්‍රවේශ මාර්ගය .*- දඹුල්ල නගරයේ සිට මාතලේ මාර්ගයේ කි. මී. 7 පමණ පැමිණ කලුන්දෑව හංදියෙන් වමට හැරී කලුන්දෑව මාර්ගයේ මීටර් 500 පමණ ගිය විට දකුණ පැත්තේ පිහිටි මෙම ඉඩම හමුවේ.

චමින්ද ජනක තුම්බොවිල යන අයට ලබාදුන් මූල්‍ය පහසුකම් වෙනුවෙන් බැඳුම්කරුවන් වශයෙන් හැටන් නැෂනල් බැංකුව පීඑල්සී වෙත උකස් කරනු ලද දේපළ 2014 ජුනි 18 වැනි බදාදා පෙ. ව. 11.00 ට ආරම්භව පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2013 නොවැම්බර් මස 22 වැනිදා *රජයේ ගැසට් පත්‍රය* ද, 2014 මාර්තු මස 18 වැනිදා ඩේලිමිරර් ලක්බිම සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ගෙවීම් කරන පිළිවෙල.*- සාර්ථක ගැනුම්කරු විසින් මිල තීන්දු වූ වහාම පහත සඳහන් ගෙවීම් මුදලින් කළ යුතුයි.

1. ගැනුම් මිලෙන් සියයට 10%ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% (සියයට එක) දේශීය විකුණුම් බද්ද,
3. විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක) වෙන්දේසිකරුගේ කොමිස් මුදල,
4. ලිපිකරු හා සෝෂක ගාස්තුව රු. 500,
5. විකුණුම් පිරිවැය හා වෙනත් අයකිරීම් වෙතොත් ඒවා,
6. වෙන්දේසිය සහතික කිරීම සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ශ්‍රී ලංකා රජයේ හෝ වෙනත් බල අධිකාරියක් මගින් පනවා ඇති වෙනත් ව්‍යවස්ථාපිත අය බදු තීරු බදු හෝ අයකිරීම් අදාල වේ නම් ඒවා ද සමග වෙන්දේසි දිනසිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු හා වෙනත් අදාල ලිපිලේඛන කොළඹ ටී. බී. ජයා මාවත, අංක 479 හැටන් නැෂනල් බැංකුව පී එල් සී සාමාන්‍යාධිකාරී (නැවත අයකර ගැනීම්) වෙතින් පරීක්ෂා කර බැලිය හැකිය.

ඩැලස් කෙලාට්,
බලයලත් වෙන්දේසිකරු.

අංක 146/3, කල්දේරා ගාඩින්ස් දුටුගැමුණු වීදියෙන් හැරී,
කොහුවල.
දුරකථන අංක : 011-4302622 011- 4302623
ෆැක්ස් අංකය : 2856013.

05-519

## සෙලාන් බැංකුව පීඑල්සී - කොළඹ කොටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ රත්මලාන සිය ලියාපදිංචි කාර්යාලය පිහිටා ඇති ව්‍යාපාර ලියාපදිංචි අංක එන් පීවී 2326 දරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන (කලින් ලියාපදිංචි අංක එන් (පී වී එස්) 1206 දරන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ) ටී මාස්ටර්ස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායී වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එන්. අම්බලවානර් විසින් සාදන ලද 1956.07.15 දිනැති අංක 111 දරන සැලැස්මේ නිරූපනය වන තිස්ස මාවත වරිපනම් අංක 16 දරන ලේඩි කැතරින් ග්‍රූප් නමැති එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් 75 ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 111 දරන සැලැස්ම අනුව පර්චස් විසි දෙකයි දශම පහක් (අ. 0 රූ. 0 පර්. 22.5) විශාල ඉඩම.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අම්බලවානර් විසින් සාදන ලද 1956.06.15 දිනැති අංක 111 දරන සැලැස්මේ නිරූපනය වන තිස්ස මාවත වරිපනම් අංක 16 දරන ලේඩි කැතරින් ග්‍රූප් නමැති එහි පිහිටි ගොඩනැගිල්ල සමග ඉඩමේ ලොට් 69 බී ලකුණු කළ බෙදාවෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 111 දරන සැලැස්ම අනුව පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20) ක් විශාල ඉඩම.

පහත සඳහන් මාර්ගය තුළ උඩින් සහ යටින් මාර්ග අයිතිය සමග

පෙර කී තෙලවල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එස්. අම්බලවානර් විසින් සාදන ලද 1956.06.15 දිනැති අංක 111 දරන සැලැස්මේ නිරූපනය වන ලේඩි කැතරින් ග්‍රූප් නමැති ඉඩමේ ලොට් 74 (පාර සඳහා වෙන් කිරීම) ලකුණු කළ බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කොටස එකී අංක 111 දරන සැලැස්ම අනුව රූඩ් දෙකයි පර්චස් තිස් අටක් (අ. 0 රූ. 2 පර්. 38) ක් විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2014 ජූනි මස 05 වැනි දින පෙරවරු 10.30 ට එම දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.*- කොළඹ කොටුවේ සිට ගාලු පාර ඔස්සේ රත්මලාන බොරුපන දක්වා පැමිණ වම්පසට ඇති බොරුපන පාරට හැරෙන්න. එම මාර්ගයේ තවත් කි. මී. 1.2ක පමණ දුරක් ගොස් දකුණු පසට ඇති තිස්ස මාවතට හැරෙන්න. එම මාර්ගයේ තවත් මීටර් 100 ක පමණ දුරක් ගිය විට අදාළ දේපළ පිහිටා ඇත.

යෝජනා සම්මුති දැන්වීම. - *රජයේ ගැසට් පත්‍රයේ* 2014.03.07 වැනි දින පළ වී ඇති අතර ලංකාදීප, ඩේලිමිරර් පුවත්පත්වල 2014.02.24 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2014.02.19 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්. ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුලත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුලත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 2456482, 2456479.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක : 011- 3068185, 011-2572940.

05-506

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී - ජාඇල ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. (ලියාපදිංචි අංක පී කිව් 116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ කටුනායක සීදුව නගර සභා සීමාවේ අමන්දොලුව ගමෙහි පිහිටා ඇති ඇටඹගහවත්ත නමැති බෙදා වෙන් කළ ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. එඩ්වඩ් විසින් 2007 අප්‍රේල් මස 16 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 4272 හි ලොට් 11 දරන පර්චස් දහයක් (අ. 0 රූ. 0 පර්. 10) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සියලු දේත් සමඟ වේ.

මහරගේ තුෂාර ඉන්දික පෙරේරා ණයකරු හැටියට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. ට උකස් කරන ලද ඉහත සඳහන් කළ දේපළ 2014ක් වූ ජූනි මස 09 වැනි දින පෙ. ව. 10.30 ට ඉහත ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2014.01.10 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2014.05.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* ද, 2014.05.19 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත්, බලන්න.

*ඉඩමට පිවිසීම.* - කොළඹ නගර සීමාවේ සිට (කැළණි පාලම) මීගමුව ප්‍රධාන පාරේ (ඒ 3) කි. මී. 21 පමණ ගියවිට සීදුව හංදිය හමුවේ. එතැනින් දකුණු පැත්තට ඇති කොටුගොඩ පාරේ (ප්‍රධාන පාර රද්දොලුගම හරහා) කි. මී. 1.5ක් පමණ ගොස් සීදුවෙහි පිහිටි පල්ලිය හංදිය හමුවේ. එතැනින් වමට හැරුණු පසු බේස්ලයින් පාරේ (අමන්දොලුව ප්‍රධාන පාර) කි. මී. 1.3 ඉදිරියට ගිය පසු අමන්දොලුව ලඟින් දකුණට හැරුණු විට අලුත්හේන පාර (නගර සභා තාර පාරේ) මීටර් 350ක් පමණ ගිය පසු හැරුණු විට තොටුපළ පාර (නගර සභා තාර පාර) මීටර් 150ක් පමණ ගියවිට

රත්හෝම්ස් නිවාස යෝජනා ක්‍රමය හමුවේ. එම කැබලි කර ඇති ඉඩමේ ලොට් 11, තොටුපල පාරේ සිට 2 වන කොටස අඩි 20ක් පළල පුද්ගලික පාරේ ප්‍රවේශය සහිත වේ.

*ගෙවීමේ ක්‍රමය.* - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%),
02. පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%),
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. නොතාරිස් ගාස්තුව රු. 2,000,
05. ලිපිකරු හා සෝෂක වේතනය රු. 500,
06. වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්,
07. ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ හෝ ජාඇල ශාඛාවේ තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න.

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 140,
මීගමුව පාර, ජාඇල.
දුරකථන අංක 2243614 -5
ෆැක්ස් අංකය : 2243613.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්,

අංක 182, 3 වැනි මහල, උසාවි පාර, කොළඹ 12
දුරකථන/ ෆැක්ස් 011- 2445393
ඊමේල් : senaservice@sltnet.lk

05-502

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංකය : 73279151 සහ 72974473.
ලක්ෂ්මී භවන් ෆාමසියට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2014.03.28 දිනැති අංක 1856 දරන *ගැසට් පත්‍රයේ* හා 2014.03.17 දිනැති "ඩේලිනිව්ස්", "දිනමිණ" හා "තිනකරන්" යන පුවත්පත්වල පළකරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2014.05.31 වැනි දින පෙ. ව. 11.00 ට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච් ඔක්ෂන්ස් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ සහ කොළඹ මහනගර සභා සීමාවේ, සල්පිටි කෝරළේ, පල්ලෙපත්තුවේ, වැල්ලවත්ත - උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, වැල්ලවත්ත උතුර අංක 43 දරන කොට්ඨාසයේ, වැල්ලවත්තෙහි පිහිටි ඩබ්. ඒ. සිල්වා මාවතේ, වරිපනම් අංක 83/3 සහ 83/4 දරන "කෝන්ගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් සාදන ලද 2007 මැයි 28 දිනැති අංක 265/2007 දරන පිඹුරෙහි ලොට් 7627 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 7627 උතුරට : ලොට් P 2 (1 වන චැපල් පටුමගෙහි වරිපනම් අංක 30) සහ 21 ඒ හි ලොට් Q ද, නැගෙනහිරට : 21 හි ලොට් B 2 (ඩබ්. ඒ. සිල්වා මාවතෙහි වරිපනම් අංක 83/6)සහ 21 හි ලොට් B 9 (පාර) ද, දකුණට : 21 හි ලොට් B 9 (පාර), සහ ලොට් 1129 (ඩබ්. ඒ. සිල්වා මාවතෙහි වරිපනම් අංක 83/1) ද, බස්නාහිරට : ලොට් 2989 සහ 2988 (ඩබ්. ඒ. සිල්වා මාවතෙහි වරිපනම් අංක 83/5) ද, මායිම්ව එකී අංක 265/2007 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම හතරයි පහක (අ. 0 රූ. 0 පර්. 15.45) බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේ සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි SPE 5/62 හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් 7627 පහත විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමකි.

එකී වැල්ලවත්ත ග්‍රාමයේ පිහිටි ඩබ්. ඒ. සිල්වා මාවතේ වරිපනම් අංක 83/3 සහ 83/4 දරන "කෝන්ගහවත්ත" නමැති ඉඩමෙහි වැල්ලවත්ත 2 ලියාපදිංචි පිඹුරෙහි බී 1 හි ලොට් 21 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී බී 1 හි ලොට් 21 උතුරට : 21 ඒ හි ලොට් පී 2 සහ 21 ඒ හි ලොට් කිව් ද, නැගෙනහිරට : 21 හි ලොට් බී 2 සහ 21 හි ලොට් බී 9 ද, දකුණට : 21 හි ලොට් බී 3 (පාර) ද, බස්නාහිරට : 21 හි ලොට් ඒ ද, මායිම්ව එකී ලියාපදිංචි පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම තුනයි බිංදුවක (අ. 0 රූ. 0 පර්. 15.30) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ සියලු දේ සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ Well 87/83,84 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

එකී වැල්ලවත්ත ග්‍රාමයෙහි පිහිටි "කෝන්ගහවත්ත" නැමැති ඉඩමෙහි බලයලත් මිනින්දෝරු ආර්. මුරුග පිල්ලෙ විසින් සාදන ලද 1965 දෙසැම්බර් මස 5 දිනැති අංක 176 දරන පිඹුරෙහි 21 හි ලොට් B 9 ලෙස දක්වා සීමා නිර්ණය කොට බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී 21 හි ලොට් B 9 උතුරට පිඹුරු අංක 176 හි 21 හි B 1 සහ 21 හි B 2 ද, නැගෙනහිරට : පිඹුරු අංක 176 හි 21 හි ලොට් B 6, 21 හි B 7 සහ 21 හි B 8 ද, දකුණට : මහ වීදිය (දැන් ඩබ්. ඒ. සිල්වා මාවත) ද, බස්නාහිරට : පිඹුරු අංක 176 හි 21 හි ලොට් B5, 21 හි B4 සහ 21 හි B 3 ද, මායිම්ව එකී අංක 176 දරන පිඹුරට අනුව පර්චස් දහතුනයි දශම හතයි පහක (අ. 0 රූ. 0 පර්. 13.75) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙහි SPE 5/64 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. ඩී. ආර්. මහානාම,
ප්‍රධාන කළමනාකරු.

05-511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.